Department of Education Sabaragamuwa Province/ Weekly School Department of Education Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - ගිණුම්කරණය

සතිය - 5

ශ්‍රේණිය - 12

සකස් කළේ - පී.කේ.ඩී.කේ.ඩබ්. ගුණරත්න මිය ,ර/රත්නපුර ධර්මපාල ම.වි.

නිපුණතාව 2.0 - ව්‍යාපාරයක ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්කරණ සමීකරණය ඇසුරෙන් ඉදිරිපත් කරයි.

නිපුණතා මට්ටම 2.2 - ව්‍යාපාරයක ගනුදෙනු හා සිද්ධීන් මගින් හිමිකම පෙන්වන ආකාරය අනාවරණය කරයි.

<u>අභ්‍යාස 01</u>

චානක මහතා 2020/01/01 දින පරිගණක අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළ අතර පළමු සතිය තුළ සිදු වූ ගනුදෙනු පහත වේ.

01/01 චානක මහතා සතු රු.500,000ක මුදලක් ද රු.1,000,000ක් වටිනා ගොඩනැගිල්ලද යොදවා ව්‍යාපාරය ආරම්භ කිරීම.

01/02 පරිගණක අලුත්වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගත්තා රු.200,000

01/03 රු.120,000ක් වටිනා තම පෞද්ගලික ලී බඩු ව්‍යාපාරයට යෙදවූවා.

01/04 පරිගණක අලුත්වැඩියා කිරීමෙන් රු.50,000ක් ලද අතර ඒ සඳහා රු.15,000ක ද්‍රව්‍ය භාවිත කරන ලදී.

01/05 ව්‍යාපාරය පුළුල් කිරීමට හිතවතකුගෙන් රු.200,000ක මුදලක් ණයට ගත්තා.

01/06 ඔහුගේ සහායකයාට රු.10,000ක්ද ඔහුගේ පෞද්ගලික දුරකථන බිල රු.5,000ක්ද ව්‍යාපාරයේ මුදලින් ගෙව්වා.

01/07 රු.45,000ක සේවා සැපයීම වෙනුවෙන් ලද මුදල රු.30,000කි.ඉතිරිය පසුව ගෙවීමට ගනුදෙනුකරුවන් එකඟ විය.මේ සඳහා වැයවූ ද්‍රව්‍ය පිරිවැය රු.20,000කි.

අවශ්‍ය වන්නේ,

1.ඉහත ගනුදෙනු මගින් වත්කම් = හිමිකම් + වගකීම් සමීකරණයට වන බලපෑම +/- වශයෙන් වටිනාකම් සහිතව දක්වන්න.

2.ඉහත ගනුදෙනු මගින් වත්කම් = හිමිකම + (ආදායම්-වියදම්) + වගකීම් සමීකරණයට වන බලපෑම +/- වශයෙන් වටිනාකම් සහිතව දක්වන්න.

3.ඉහත දැක්වූ ආදායම හා වියදම ඇසුරින් 2020 ජනවාරි මාසයට අදාළ ලාභය/අලාභය ගණනය කරන්න.

4.ශුද්ධ වත්කම් ඇසුරෙන් 2020 ජනවාරි මාසයට අදාළව ලාභය/අලාභය ගණනය කරන්න.